

# බඩගිනි තාරාවා

රුනිති අකිත්මා බණ්ඩාර

බඩගිනි තාරාවා

රැනිති අකිත්මා බණ්ඩාර.

කර්තෘ ප්‍රකාශනයකි.

පළමු මුද්‍රණය 2023

ISBN 978-624-206-734-6

# පිදුම

මේ කතාව ලියන්න ත් චිත්‍ර අඳින්න ත් ඉවසීමෙන් මාත් එක්ක හිටපු අත්තම්මාට ත්

පංති භාර දිල්රුක්ෂි ගුරු මෑණියන්ට ත්

අම්මාටත් අප්පච්චීටත්

ආදරයෙන්.........

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි  එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින්  ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුමකරගත් මහමායා  දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින්  "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි

 2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත් දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු   මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම  නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත්කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි

ශෂිකලා
සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023 10 20

ඔන්න එකමත් එක කාලෙක තාරා පවුලක් හිටියා.මේ පවුලේ තාරා අම්මායි තාරා බබාලා තුන් දෙනෙක් හිටියා.එක තාරා බබෙක් හිටියා එයා හරිම දඟයි. අම්මා කියන දේ පොඩ්ඩක් වත් අහන්නේ නෑ.



Scanned with CamScanner

දවසක් මේ තාරා අම්මා තාරා බබාලා තුන් දෙනා එක්ක එළියට ගියා පීනගෙන. මේ වෙලවේ අර අම්මා කියන දේ අහන්නේ නැති තාරා පැටියාට මේ තාරා අම්මාවයි අනිත් තාරා බබාලා දෙන්නාවයි මග ඇරිලා.



මේ අතරමං වෙච්ච තාරා පැටියා පීනගෙන පීනගෙන ඉස්සරහටම ගියා.

මෙහෙම යනකොට මේ තාරාවා ට හොඳ බඩගින්නක් ආවාලු. මේ තාරා පැටියා හිටපු තැන මාලු කන්න බැලුවාට මාලු හිටියේ නෑ.



ඊට පස්සේ තාරාවා පීනගෙන යනකොට ඉබ්බෙක් හම්බුනාලු.

මේ තාරාවා ඉබ්බාගෙන් ඇහුවා මාලු ඉන්න තැනක් කියන්න කියලා. ඊට පස්සේ ඉබ්බා දුර ඈත තියෙන විලක් ගැන කිව්වා.



තාරාවා ඒ විලට පීනගෙන ගියා. එතන මාලුවෝ ගොඩාක් හිටියා. තාරාවා සතුටින් මාලු කෑවා.

තාරාවාගේ බඩ පිරුණා.



තාරාවා මාලු කාලා ආයෙත් පීනාගෙන ගියා.මේ තාරාවා ආයේ යනකොට ඉබ්බාව හම්බුනා.

ඉබ්බාව හම්බෙලා ස්තූති කරා.



ටික දුරක් යනකොට මේ තාරාවාට එයාගේ අම්මාවයි අනිත් තාරා බබාලා දෙන්නාවයි හම්බුනා.

අම්මා තාරා බබාට අවවාද කරලා ගෙදර එක්කන් ගියා.





## පසවුදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාන හැකියාවන් ඔප්නැංවීම තුළින්  රටේ සාහිත්‍ය ප්‍රබෝදයක් ඇතිකිරීම  වැනි බහුවිධ පරමාර්ථ ඇතිව  2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන  ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමානයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනවූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැගීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි මෙම නිර්මාන රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතක තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට  මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි  ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි  පතමු

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

2023 10 20

ISBN 978-624-206-734-6